**ශීර්ෂ 312 - බස්නාහිර පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

**1 දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සහජීවනය සහ තිරසාර සංවර්ධනය තුළින් බස්නාහිර පළාත පෙරට

**1.2 මෙහෙවර**

මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් බස්නාහිර පළාතේ සියළුම ප්‍රජාවට සෙත සැලසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදා කිරීම

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

බස්නාහිර පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.14,904,313,000 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.13,306,497,120 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.1,597,815,880 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10.7 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 11,699,313,000 | 11,699,313,000 | - | - |
| මූලධන | 3,205,000,000 | 1,607,184,120 | 1,597,815,880 | 49.85 |
| එකතුව | 14,904,313,000 | 13,306,497,120 | 1,597,815,880 | 10.72 |

මධ්‍යම රජය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.